# වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය
# ජාතික සමුපකාර සංවර්ධන ආයතනය - පොල්ගොල්ල

**(1)** .තනතුරු නාමය :- **අධ්‍යක්ෂ (අධ්‍යයන හා සංවර්ධන) (පුරප්පාඩු - 01)**

**(2)** .සේවා ශ්‍රේණිය :- **ජ්‍යෙෂ්ඨ කළමනාකාර (HM 1-1)**

**(3)** .අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද

බාහිර අයදුම්කරුවන්

අධ්‍යාපන

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සමාජ විද්‍යාව, ආර්ථික විද්‍යාව,ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය පරිපාලනය, මානව සම්පත් කළමනාකරණය, කළමනාකරණය,වාණිජ්‍ය යන විෂය ක්ෂේත්‍රයකින් ලබා ගත් ප්‍රථම උපාධිය සහ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

සේවා පළපුරුද්ද

ප්‍රථම උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසු පිළිගත් රාජ්‍ය ආයතනයක හෝ විශ්ව විද්‍යාලයක කළමනාකරණ මට්ටමේ වසර 15ක පළපුරුද්දක් තිබීම.

අතිරේක සුදුසුකම්

පරිගණක භාවිතය පිළිබඳ හැකියාව හා ඉංග්‍රීසි භාෂාවෙන් රාජකාරි කටයුතු කිරීමේ හැකියාව අතිරේක සුදුසුකම් වේ.

අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත I හෝ II)

I. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
II. ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ ජ්‍යෙෂ්ඨ අධ්‍යයන/පර්යේෂණ (AR-2) සේවා ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ජ්‍යෙෂ්ඨ පුස්තකාලයාධිපති හා ජ්‍යෙෂ්ඨ පර්යේෂක තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**(4)** .වයස

අවුරුදු 35ට නොඅඩු හා අවුරුදු 55ට නොවැඩි අය විය යුතුය.අභ්‍යන්තර අයදුම්කරුවන්ට සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**(5)** .වැටුප් ක්‍රමය

සේවා ශ්‍රේණියට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය:

HM 1-1 රු.80, 295 -15× 2,270 – රු. 114,345/–

**(6)** .තනතුරට පැවරෙන කාර්යයන්

- ආයතනයේ අධ්‍යාපනික හා පුහුණු කටයුතු කළමනාකරණය කිරීම.
- සමුපකාර සංවර්ධනයට අදාලව සමුපකාර පර්යේෂණ ව්‍යාපෘති කටයුතු,ප්‍රචාරණ කටයුතු සැලසුම් කිරීම හා මෙහෙයවීම.
- ආයතනයේ සැලසුම්වලට අනුකූලව නව සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- සමුපකාර ක්ෂේත්‍රය සඳහා අවශ්‍ය උපදේශන සේවා ලබා දීම.
- ආයතනයේ ප්‍රකාශන හා මුද්‍රණ අංශයේ කටයුතු ප්‍රවර්ධනය කිරීම.
- වාර්ෂිකව අධ්‍යයන හා සංවර්ධන සැලසුම් සකස් කර ඉදිරිපත් කිරීම.
- අධ්‍යයන අංශයේ පරිපාලනය මෙහෙයවීමෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයාට අවශ්‍ය සහාය ලබා දීම.
- අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් හා මඟපෙන්වීම අනුව අවශ්‍ය විය හැකි අනෙකුත් අදාල රාජකාරි කටයුතු ඉටු කිරීම.

**(7).** බඳවා ගැනීමේ ක්‍රමවේදය

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා ප්‍රතිඵල මත තෝරා ගනු ලැබේ.

**(8).** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදි ලකුණු ලබා දිමේ ක්‍රමය

| | | |
|---|---|---|
| I | අදාල අතිරේක පළපුරුද්ද | - ලකුණු 30 |
| II | අතිරේක අධ්‍යාපන/වෘත්තිය සුදුසුකම් | - ලකුණු 30 |
| III | අනෙකුත් කාර්යය සාධනයන් හා කුසලතා | - ලකුණු 15 |
| IV | සම්මුඛ පරීක්ෂණයේදි කාර්ය සාධනය | - ලකුණු 25 |
| | | ලකුණු **100** |

අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිලධාරි
ජාතික සමුපකාර සංවර්ධන ආයතනය
පොල්ගොල්ල
2025.01.24